# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,469 - 2025 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා - 2025.12.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශය ආදිය … … | — | රජයේ නිවේදන … … … … … | |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය … … | — | මිල පාලන දැන්වීම් … … … … … | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය … … | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් … … … … … | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය … … | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන … … … … … | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය … … | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා … … … … … | — |
| වෙනත් පත්කිරීම් ආදිය … … | | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් … … … … … | 1510 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය … … | — | නැවියන්ට දැන්වීම් … … … … … | — |
| | — | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් … … … … … | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 16 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 02 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1509 - B 82749- (2025/12)
E - 01

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය

2025 දෙසැම්බර් මස 15 දින පවත්වන ලද නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන යෝජනා සම්මතය විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරන ලදී; එනම් -

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (NDB) ආයතනය සහ මහජන බැංකුව (PB) වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එන්. එම්. හේවාජුලිගේ විසින් සහතික කරන ලද 2017.01.10 දින අංක 1640 දරන ප්‍රාථමික සහගාමී උකස් බැඳුම්කරය මගින් සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එන්. එම්. හේවාජුලිගේ විසින් සහතික කරන ලද 2019.11.15 දින අංක 1832 දරන ප්‍රාථමික සහගාමී උකස් බැඳුම්කරය මගින් උකස්කර පවරාදෙන ලද මෙහි උපලේඛනවල සවිස්තරාත්මකව විස්තරකර ඇති දේපළ සහ පරිශ්‍ර ඇපයට තබා ඒවාට එරෙහිව (මෙහි මින්මතු "NDB" යනුවෙන් සඳහන් කරනු ලබන) නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය විසින් ප්‍රදානය කරන ලද ණය මුදල්/ මූල්‍ය පහසුකම් මත අයවිය යුතු මුදල් ආපසු ගෙවීම ස්වකීය ලියාපදිංචි කාර්යාලය අංක 265, ගාලුපාර, කොළඹ 03 යන ලිපිනයේ පිහිටා ඇත්තා වූ ද ලියාපදිංචි කිරීමේ අංක PV 18184 යටතේ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථාපරිදි සංස්ථාගත කර ඇති සමාගමක් වූ ද ("ණයගැනුම්කරු" වන) ලංකා හොටෙල්ස් ඇන්ඩ් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් පැහැර හැර ඇති හෙයින් ද;

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එන්. එම්. හේවාජුලිගේ විසින් සහතික කරන ලද ඉහත කී 2017.01.10 දින අංක 1640 දරන ප්‍රාථමික සහගාමී උකස් බැඳුම්කරය යටතේ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එන්. එම්. හේවාජුලිගේ විසින් සහතික කරන ලද 2019.11.15 දින අංක 1832 දරන ප්‍රාථමික සහගාමී උකස් බැඳුම්කරය යටතේ මෙහි පළමු සහ දෙවන උපලේඛනවල විස්තරකර ඇති දේපළවල සහ පරිශ්‍රවල බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිකරු වන ලංකා හොටෙල්ස් ඇන්ඩ් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් ස්වකීය බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිය, හිමිකම සහ සම්බන්ධතාවය නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (NDB) ආයතනය සහ මහජන බැංකුව (PB) වෙත උකස්කර ඇති හෙයින් ද;

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එන්. එම්. හේවාජුලිගේ විසින් සහතික කරන ලද 2017.01.10 දින අංක 1640 දරන ඉහත කී ප්‍රාථමික සහගාමී උකස් බැඳුම්කරය මත සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එන්. එම්. හේවාජුලිගේ විසින් සහතික කරන ලද 2019.11.15 දින අංක 1832 දරන ඉහත කී ප්‍රාථමික සහගාමී උකස් බැඳුම්කරය මත 2025.11.30 දිනය වන විට NDB බැංකුව වෙත රුපියල් බිලියන දෙකයි මිලියන දෙසිය හතළිස් හතරයි පන්ලක්ෂ දාසය දහස් පන්සිය පහළොවයි ශත දාහතරක් වූ මුදලක් (රු. 2,244,516,515.14) සහ එක්සත් ජනපද ඩොලර් මිලියන විසිතුනයි දාහතර දහස් දෙසිය පහයි ශත පනස් හතරක් වූ මුදලක් (එ.ජ.ඩො. 23,014,205.54) හෝ එයට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් වූ මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද;

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩුකිරීමෙන් පසුව ප්‍රධාන පනතේ 13 වගන්තිය ප්‍රකාරව දරන ලද ප්‍රචාරක පිරිවැය, විකුණුම් පිරිවැය සහ වෙනත් යම් ගාස්තු ද සමග ඉහත කී රුපියල් බිලියන දෙකයි මිලියන දෙසිය හතළිස් හතරයි පන්ලක්ෂ දාසය දහස් පන්සිය පහළොවයි ශත දාහතරක් වූ මුදලක් (රු. 2,244,516,515.14) සහ එක්සත් ජනපද ඩොලර් මිලියන විසිතුනයි දාහතර දහස් දෙසිය පහයි ශත පනස් හතරක් වූ මුදලක් (එ.ජ.ඩො. 23,014,205.54) හෝ එයට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් වූ මුදලක් සහ 2025 දෙසැම්බර් මස 01 දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් -

(i) (මාසිකව නැවත මිල තීරණය කරනු ලබන පරිදි) සතිපතා AWLPR + වර්ෂයකට 5.5% ක් වූ අනුපාතිකය යටතේ රුපියල් බිලියන එකයි මිලියන අසූහයයි හයලක්ෂ අනූනව දහස් හත්සිය විසි හතරක් වූ (රු. 1,086,699.724.00) මූලික හිඟ මුදලක් මත පොළිය ද;

(ii) (මාසිකව නැවත මිල තීරණය කරනු ලබන පරිදි) සතිපතා AWLPR + වර්ෂයකට 5.5% ක් වූ අනුපාතිකය යටතේ රුපියල් මිලියන විසි එකයි අට ලක්ෂ හැටතුන්දහස් එකසිය පනස් නවයයි ශත දාහතක් වූ (රු. 21,863,159.17) මූලික හිඟ මුදලක් මත පොළිය ද;

(iii) (මාසිකව නැවත මිල තීරණය කරනු ලබන පරිදි) සතිපතා AWLPR + වර්ෂයකට 5.5% ක් වූ අනුපාතිකය යටතේ රුපියල් මිලියන හතළිස් හතරයි හත්ලක්ෂ තිස්නවදහස් එකසිය හතළිස් නවයයි ශත තිස් හතක් වූ (රු. 44,739,149.37) මූලික හිඟ මුදලක් මත පොළිය ද;

(iv) (කාර්තු වශයෙන් නැවත මිල තීරණය කරනු ලබන පරිදි) මාස 3ක SOFR + වර්ෂයකට 8% ක් වූ අනුපාතිකය යටතේ එක්සත් ජනපද ඩොලර් මිලියන

දාහතරයි එක්ලක්ෂ අනූදහස් දහයක් වූ (එ.ජ.ඩො. 14,190,010.00) මූලික හිඟ මුදලක් මත හෝ එයට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් වූ මූලික හිඟ මුදලක් මත පොළිය ද;

(v) (කාර්තු වශයෙන් නැවත මිල තීරණය කරනු ලබන පරිදි) මාස 3 ක SOFR + වර්ෂයකට 8%ක් වූ අනුපාතිකය යටතේ එක්සත් ජනපද ඩොලර් තුන්ලක්ෂ අනූනව දහස් පන්සිය අනූපහයි ශත අසූ අටක් වූ (එ.ජ.ඩො. 399,595.88) මූලික හිඟ මුදලක් මත හෝ එයට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් වූ මූලික හිඟ මුදලක් මත පොළිය ද;

(vi) (කාර්තු වශයෙන් නැවත මිල තීරණය කරනු ලබන පරිදි) මාස 3ක SOFR + වර්ෂයකට 8%ක් වූ අනුපාතිකය යටතේ එක්සත් ජනපද ඩොලර් දෙලක්ෂ හාරදහස් පන්සිය හැටහයයි ශත අසූහතරක් වූ (එ.ජ.ඩො. 204,566.84) මූලික හිඟ මුදලක් මත හෝ එයට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් වූ මූලික හිඟ මුදලක් මත පොළිය ද;

අයකර ගැනීම සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එන්. එම්. හේවාජුලිගේ විසින් සහතික කරන ලද 2017.01.10 දින අංක 1640 දරන ඉහත කී ප්‍රාථමික සහගාමී උකස් බැඳුම්කරය මගින් සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එන්. එම්. හේවාජුලිගේ විසින් සහතික කරන ලද 2019.11.15 දින අංක 1832 දරන ඉහත කී ප්‍රාථමික සහගාමී උකස් බැඳුම්කරය මගින් NDB බැංකුව වෙත උකස් කරන ලද පහත උපලේඛනවල විස්තර කර ඇති දේපළ, අංක 6A, ෆෙයාර්ෆීල්ඩ් උද්‍යානය, කොළඹ 08 යන ලිපිනයේ පදිංචි බලයලත් වෙන්දේසිකරුවන් වන එම්/එස් ෂොක්මන් සහ සමරවික්‍රම බලයලත් වෙන්දේසිකරුවන් යන නාමය, විලාසය සහ සමාගම් නාමය යටතේ හවුල් ව්‍යාපාරයක් වශයෙන් ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යනු ලබන ෂොක්මන් සහ සමරවික්‍රම යන ආයතනයේ බලයලත් වෙන්දේසිකරුවන් වන අංක 391/1, හෝකන්දර දකුණ, හෝකන්දර යන ලිපිනයේ පදිංචි නවීන්ද තුෂාර බෙන්ජමින් ද අල්විස් සමරවික්‍රම, අංක 61, ශාන්ත රීටා පාර, ගල්කිස්ස යන ලිපිනයේ පදිංචි අනුජ ඉන්දික ලෙනාඩ් ද අල්විස් සමරවික්‍රම මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි ("ප්‍රධාන පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින් NDB බැංකුවේ බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

**පළමු උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහා නගර සභා පරිපාලන සීමාව ඇතුළත කොල්ලුපිටිය කොට්ඨාස අංක 37 දරන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද, ගාලු පාර, වරිපනම් අංක 265, 265/15, 265/40, 265/25, 265/27 සහ 265/21 දරන "ඉසබෙල් කෝට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා ලියාපදිංචි බලයලත් මිනින්දෝරු අයි. ඒ. විජේතිලක විසින් සාදන ලද 2013 දෙසැම්බර් මස 20 දින අංක 3105 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ ද (ලියාපදිංචි බලයලත් මිනින්දෝරු කේ. ඩී. ෆිලික්ස් ආර්. පෙරේරා විසින් සාදන ලද 2012 මාර්තු මස 27 දින අංක 2907 දරන පිඹුරේ නිරූපිත ලොට් A දරන ඉඩම් කොටසේ, ලියාපදිංචි බලයලත් මිනින්දෝරු අයි. ඒ. විජේතිලක විසින් සාදන ලද 2012 ජූලි මස 16 දින අංක 2934 දරන පිඹුරේ ලොට් A දරන ඉඩම් කොටසේ සහ එම බලයලත් මිනින්දෝරුවරයා විසින්ම සාදන ලද 2013 දෙසැම්බර් මස 18 දින අංක 3104 දරන පිඹුරේ ලොට් අංක 1 දරන ඉඩම් කොටසේ නැවත මැනීමක් සහ ඒකාබද්ධ කිරීමක් වන්නා වූ ද,)

*උතුරට* : පෞද්ගලික පාර ද;

*නැගෙනහිරට* : ලිබර්ටි ප්ලාසා පරිශ්‍රය ද;

*දකුණට* : නිහාල් විජේසිංහ යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ පෞද්ගලික පාර ද; (බලයලත් මිනින්දෝරු කේ. කේ. කිඩ්නාපිල්ලෙයි විසින් සාදන ලද 1978 නොවැම්බර් මස 09 දින අංක 2420 දරන පිඹුරේ ලොට් E);

*බටහිරට* : ගාලු පාර ද (කොල්ලුපිටිය පාර).

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ඉහත කී අංක 3105 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් බිංදුවයි දශම තුනයි එකක් (රූ.3, පර්. 0.31) *හෙවත්* හෙක්ටයාර් බිංදුවයි දශම තුනයි බිංදුවයි හතරයි තුනයි එකක් වූ ද, (හෙක්ටයාර් 0.30431) ඉහත කී ලොට් අංක 1 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

**ඉහත කී දේපළ පහත සඳහන් ඉඩම් කොටස්වල ඒකාබද්ධ කිරීමක් වේ. එනම් -**

(i) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කොල්ලුපිටිය කොට්ඨාස අංක 37 දරන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද, ගාලු පාර, වරිපනම් අංක 265 සහ 265/15 දරන "ඉසබෙල් කෝට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් සහ ඉඩම සම්බන්ධයෙන් බලයලත් මිනින්දෝරු කේ. ඩී. එෆ්. ආර්. පෙරේරා විසින් සාදන ලද 2012 මාර්තු මස 27 දින අංක 2907 දරන පිඹුරේ "ලොට් A" ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : පෞද්ගලික පාර ද; නැගෙනහිරට : ගාලු පාර, වරිපනම් අංක 265/21 දරන

පරිශ්‍රය සහ පෞද්ගලික පාර ද (බලයලත් මිනින්දෝරු කේ. කිඩ්නපිල්ලෙයි විසින් සාදන ලද 1978 නොවැම්බර් මස 09 දින අංක 2420 දරන පිඹුරේ ලොට් E); දකුණට: පෞද්ගලික පාර ද (බලයලත් මිනින්දෝරු කේ. කිඩ්නපිල්ලෙයි විසින් සාදන ලද 1978 නොවැම්බර් මස 09 දින අංක 2420 දරන පිඹුරේ ලොට් E); බටහිරට : ගාලු පාර ද (කොල්ලුපිටිය පාර) යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ E 15/94 දරන වෙළුම/ පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද අංක 2907 දරන ඉහත කී පිඹුර අනුව ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දොළහයි දශම හතයි පහක් වූ ද (රූ.2, පර්. 12.75) ඉහත කී "ලොට් A" දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

(ii) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කොල්ලුපිටිය කොට්ඨාස අංක 37 දරන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද, ගාලු පාර, වරිපනම් අංක 265/25, 265/27 සහ 265/40 දරන "ඉසබෙල් කෝට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා සහ ඉඩම සම්බන්ධයෙන් බලයලත් මිනින්දෝරු අයි. ඒ. විජේතිලක විසින් සාදන ලද 2012 ජූලි මස 16 දින අංක 2934 දරන පිඹුරේ "ලොට් A" ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : පෞද්ගලික පාර ද; නැගෙනහිරට : ලිබර්ටි ප්ලාසා පරිශ්‍රය ද; දකුණට : නිහාල් විජේසිංහ විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ පාර ද (බලයලත් මිනින්දෝරු කේ. කිඩ්නපිල්ලෙයි විසින් සාදන ලද 1978 නොවැම්බර් මස 09 දින අංක 2420 දරන පිඹුරේ ලොට් E) බටහිරට : ගාලු පාර, වරිපනම් අංක 265/21 දරන පරිශ්‍රය ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ E 15/95 දරන වෙළුම/පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද අංක 2934 දරන ඉහත කී පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හතයි පහක් වූ ද (පර්. 20.75) ඉහත කී "ලොට් A" දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේද වේ.

(iii) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කොල්ලුපිටිය කොට්ඨාස අංක 37 දරන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද, කොල්ලුපිටිය පාර, වරිපනම් අංක 265/21 දරන පරිශ්‍රය සඳහා සහ පරිශ්‍රය සම්බන්ධයෙන් බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද 1993 ජූලි මස 19 දින අංක 4085 දරන පිඹුරේ "ලොට් BC3" ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : කොල්ලුපිටිය පාර, වරිපනම් අංක 263 දරන පරිශ්‍රය ද; නැගෙනහිරට: අංක 2420 දරන පිඹුරේ නිරූපිත කොල්ලුපිටිය පාර, වරිපනම් අංක 265/65 දරන ලොට් D ද; දකුණට : අංක 2420 දරන පිඹුරේ ලොට් E ද (අඩි 20 ක් පුළුල් පාරක් සඳහා වෙන් කළ ඉඩම් කොටස) (අනුමත පෞද්ගලික වීදිය); බටහිරට : අංක 4085 දරන පිඹුරේ ලොට් BC2 ද; යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ E 16/128 දරන වෙළුම/ පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද අංක 4085 දරන ඉහත කී පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම නවයයි බිංදුවක් වූ ද (පර්. 6.90) ඉහත කී "ලොට් BC3" දරන ඉඩම් කොටස වේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කොට්ඨාස අංක 37 දරන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද, ගාලු පාර, වරිපනම් අංක 265/42, 265/47, 267/7, 267/9, 267/3 සහ 3A සහ 265/5 දරන "ඉසබෙල් කෝට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා සහ ඉඩම සම්බන්ධයෙන් බලයලත් මිනින්දෝරු අයි. ඒ. විජේතිලක විසින් සාදන ලද 2012 ජූලි මස 16 දින අංක 2932 දරන පිඹුරේ "ලොට් A" ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට: පාර ද (බලයලත් මිනින්දෝරු කේ. කිඩ්නපිල්ලෙයි විසින් සාදන ලද 1978 නොවැම්බර් මස 09 දින අංක 2420 දරන පිඹුරේ ලොට් E); නැගෙනහිරට : නිහාල් විජේසිංහ විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. පෙරේරා විසින් සාදන ලද 1974 නොවැම්බර් මස 10 දින අංක 1418 දරන පිඹුරේ ලොට් L ද; දකුණට : පාර ද (බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. පෙරේරා විසින් සාදන ලද 1974 නොවැම්බර් මස 10 දින අංක 1418 දරන පිඹුරේ ලොට් R1 සහ ලොට් R2); බටහිරට : ගාලු පාර, වරිපනම් අංක 267 දරන පරිශ්‍රය සහ පාර ද (බලයලත් මිනින්දෝරු කේ. කිඩ්නපිල්ලෙයි විසින් සාදන ලද 1978 නොවැම්බර් මස 09 දින අංක 2420 දරන පිඹුරේ ලොට් E) යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ E 15/96 දරන වෙළුම/පත්තිරුව යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද, අංක 2932 දරන ඉහත කී පිඹුර අනුව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් හතයි දශම හතයි නවයක් වූ ද (රූ.1, පර්. 37.79) ඉහත කී "ලොට් A" දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේද වේ.

පහත දැක්වෙන ඉඩම්වලට ඉහළින් සහ ඒ ඔස්සේ යෑම ඒමේ මාර්ග පරවශතා අයිතිය ද සමග වේ; එනම්

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කොල්ලුපිටිය කොට්ඨාස අංක 37 දරන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. පෙරේරා විසින් සාදන ලද 1974 නොවැම්බර් මස 10 දින අංක 1418 දරන පිඹුරේ "ලොට් $R^1$" ලෙස ලකුණු කර නිරූපණය කර

ඇත්තා වූ ද (මාර්ගයක් සඳහා වෙන් කළ ඉඩම් කොටස) උතුරට : ලොට් B, D, F සහ H ද; නැගෙනහිරට : ලොට් $R^2$ (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කල ඉඩම් කොටස) සහ ලොට් අංක 1 ද; දකුණට : ලොට් A, C, E සහ G ද; බටහිරට: කොල්ලුපිටිය පාර ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ඉහත කී අංක 1418 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් තිස් අටයි දශම එකයි හයක් වූ ද (පර්. 38.16) කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ A1064/262 දරන හිමිකම යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද ඉහත කී "ලොට් $R^1$" දරන (පාරක් සඳහා වෙන් කළ) බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කොල්ලුපිටිය කොට්ඨාස අංක 37 දරන කොට්ඨාසයේ පිහිටා ඇත්තා වූ ද "හයි ක්‍රොස්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා සහ ඉඩම සම්බන්ධයෙන් බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. පෙරේරා විසින් සාදන ලද 1974 නොවැම්බර් මස 10 දින අංක 1418 දරන පිඹුරේ "ලොට් $R^2$" ලෙස ලකුණු කර නිරූපණයකර ඇත්තා වූ (පාරක් සඳහා වෙන් කළ ඉඩම් කොටස); උතුරට : ලොට් H, J, L සහ $R^3$ ද (අඩි 5ක් පළල කාණුවක් සඳහා වෙන් කළ ඉඩම් කොටස); නැගෙනහිරට : ලොට් N සහ O ද; දකුණට: ලොට් I, K සහ M ද; බටහිරට : ලොට් $R^1$ ද (අඩි 30ක් පළල පාරක් සඳහා වෙන් කළ ඉඩම් කොටස) යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ඉහත කී අංක 1418 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම තුනයි හතරක් වූ ද (පර්. 12.34) කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ A1064/263 දරන හිමිකම යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද ඉහත කී "ලොට් $R^2$" දරන (පාරක් සඳහා වෙන් කළ) බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කොල්ලුපිටිය කොට්ඨාස අංක 37 දරන කොට්ඨාසයේ පිහිටා ඇත්තා වූ ද "ඉසබෙල් කෝට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා සහ ඉඩම සම්බන්ධයෙන් බලයලත් මිනින්දෝරු කේ. කිඩ්නාපිල්ලෙයි විසින් සාදන ලද 1978 නොවැම්බර් මස 09 දින අංක 2420 දරන පිඹුරේ "ලොට් E" ලෙස ලකුණු කර නිරූපණයකර ඇත්තා වූ ද (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කළ ඉඩම් කොටස) උතුරට : අංක 2420 දරන ඉහත කී පිඹුරේ ලොට් A, B, C, D සහ ලොට් අංක 4 ද; නැගෙනහිරට : ඉහත කී අංක 2420 දරන පිඹුරේ ලොට් අංක 4, 5 සහ 7 ද; දකුණට : ඉහත කී අංක 2420 දරන පිඹුරේ ලොට් අංක 5, 6, 7 සහ ගාලු පාර, වරිපනම් අංක 267 දරන පරිශ්‍රය ද; බටහිරට : ඉහත කී අංක 2420 දරන පිඹුරේ ලොට් B, C සහ ගාලු පාර ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ඉහත කී අංක 2420 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් තිස්හයයි දශම තුනයි හයක් වූ ද (පර්. 36.36) කොළඹ දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ E09/36 දරන හිමිකම යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද ඉහත කී "ලොට් E" දරන (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කළ) බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

**දෙවන උපලේඛනය**

උපාංග සමග විදුලිබල සැපයුම් පද්ධතිය, ජල පොම්ප, ප්‍රධාන නල මාර්ග සහ වෙනත් උපාංග සමග ජල පහසුකම් පද්ධති උපාංගය, විදුලි සංදේශ උපාංග ඇතුලු ඒවාට සීමා නොවන ඉහත කී ඉඩම් කොටස සඳහා ස්ථිරව සම්බන්ධ කරනු ලැබ ඇති හෝ සවිකරනු ලැබ ඇති සියලු එක්ව හා වෙන් වෙන් වූ නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපාංග, සවිකුරු, සවිකිරීම් සහ සේවාවන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.

12 - 592

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - නාරාහේන්පිට ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණුදෙනුකරුගේ නම : ජීවනී ජයතිලක සැලෝන් ඇන්ඩ් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2025.10.27 දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, ඉහත කී ජීවනී ජයතිලක සැලෝන් ඇන්ඩ් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ් "බන්ධනදායී" ලෙස ද විදාන පතිරණගේ අජිත් දීප්ත ජයතිලක සහ රත්නායක මුදියන්සේලාගේ ජීවනී සමන් රත්නායක යන අය "උකස්කරුවන්" ලෙස ද ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එස්. එන්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015.09.11 දිනැති අංක 5585 දරන

ප්‍රාථමික උකස්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. ඒ. දයානන්ද විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2017.10.19 දිනැති අංක 509 දරන ද්විතීයික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද;

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 5585 සහ 509 දරන උකස්කරය මත,

(අ) වර්ෂ 2025.09.22 දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු, රුපියල් දෙසිය දෙලක්ෂ විසි පන් දහස් දෙසිය හැත්තෑවයි ශත හැටක (රු. 20,225,270.60) මුදලක් ද, වර්ෂ 2025.09.23 දින සිට රුපියල් එකසිය අනූ පන් ලක්ෂ අසූ නව දහස් හත්සිය පනස් හතයි ශත හතළිස් එකක් (රු. 19,589,757.41) දක්වා වූ මුදල මත වර්ෂයකට 10.2% ක පොළිය ද;

(ආ) වර්ෂ 2025.09.22 දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු, රුපියල් හැට පන් ලක්ෂ හැට අට දහස් හාරසිය පනස් පහයි ශත හැට පහක (රු. 6,568,455.65) මුදලක් ද, වර්ෂ 2025.09.23 වන දින සිට රුපියල් හැට පන් ලක්ෂ හැට හත් දහස් පන්සිය හැත්තෑ දෙකයි ශත තිස් පහක් (රු. 6,567,572.35) දක්වා වූ මුදල මත වර්ෂයකට 2%ක පොළිය ද;

ඉහත කී බන්ධනදායී/ උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද; පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

ඒ කෙසේද යත්, ඉහත කී ජීවනී ජයතිලක සැලෝන් ඇන්ඩ් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ් "බන්ධනදායී" ලෙස ද විදාන පතිරණගේ අජිත් දීප්ත ජයතිලක සහ රත්නායක මුදියන්සේලාගේ ජීවනි සමන් රත්නායක යන අය "උකස්කරුවන්" ලෙස ද අංක 5585 සහ 509 දරන උකස්කරයන් මත අයවිය යුතු එකී මුලු මුදල වන රුපියල් දෙසිය හැට හත් ලක්ෂ අනූ තුන් දහස් හත්සිය විසි හයයි ශත විසි පහක (රු. 26,793,726.25) මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට දේපළ විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව අංක 182/3 (50/3), කොළොන්නාව, විහාර මාවතහි දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ (දෙල්කඳ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොරලැස්ගමුව බටහිර සී/බී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බොරලැස්ගමුවේ, වරිපනම් අංක 418, බොරලැස්ගමුව යන ස්ථානයේ පිහිටා ඇති "කොනේගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. යූ. එස්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද වර්ෂ 2014.09.07 දිනැති අංක 2736 දරන පිඹුරෙහි (බලයලත් මිනින්දෝරු පී. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද වර්ෂ 2002.11.24 දිනැති අංක 6358 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 2A දරන ඉඩම නැවත මැන සාදන ලද) ලොට් A යනුවෙන් නිරූපිත ඉඩම් කැබැල්ලට මායිම් : උතුරට : කොළඹ සිට පිළියන්දල දක්වා පාර ද; නැගෙනහිරට : කොළඹ සිට පිළියන්දල දක්වා පාර සහ සොලමන් පෙරේරා සහ අනෙක් අයට අයිති ඉඩම ද; දකුණට : සොලමන් පෙරේරා සහ අනෙක් අයට අයිති ඉඩම සහ බොරලැස්ගමුව, වරිපනම් අංක 418ඒ දරන පරිශ්‍රය ද; බස්නාහිරට : බොරලැස්ගමුව, වරිපනම් අංක 418ඒ දරන පරිශ්‍රය සහ පාර ද, යන මෙකී මායිම් තුළ පිහිටි එකී අංක 2736 දරන පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම එකයි පහ (පර්. 4.15) ක් බිම් ප්‍රමාණය සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ආදී සෑම සියලු දේ ද සමග වේ.

එකී ලොට් A දරන ඉඩම පහත දැක්වෙන ඉඩමෙහි නැවත මැන සාදන ලද්දකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ (දෙල්කඳ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ වරිපනම් අංක 57 (කොටසක්), කොළඹ පාර, බොරලැස්ගමුව පිහිටා ඇති "කොනේගහවත්ත" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද වර්ෂ 2002.11.24 දිනැති අංක 6358 දරන පිඹුරෙහි ලොට් 2A යනුවෙන් නිරූපිත ඉඩම් කැබැල්ලට මායිම් : උතුරට : පාර ද; නැගෙනහිරට : කොළඹ සිට පිළියන්දල දක්වා පාර ද; දකුණට : සොලමන් පෙරේරා සහ අනෙක් අයට අයිති ඉඩම සහ ලොට් 2B ද; බස්නාහිරට : ලොට් 2B සහ පිඹුරු අංක 11/81 හි ලොට් 1 ද යන මෙකී මායිම් තුළ පිහිටි එකී අංක 6358 දරන පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම පහ (පර්. 6.5)ක් වූ බිම් ප්‍රමාණය සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ආදී සෑම සියලු දේ ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩී. එල්. හල්වතුර,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණි - ණය අයකර ගැනීම්.

12 - 595

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.